**ශීර්ෂය 273 – පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) පුත්තලම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 267/2018 හා 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8:2 ජේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැය හෝ පිරිවැය හඳුනාගත නොහැකි නම් තක්සේරු කල අගය හෝ ගිණුම්ගත කළයුතු වුවත්, වාහන 06 ක් සහ ට්‍රැක්ටර් හා ලොරි බවුසර් 42 ක් ගිණුම් ගතකර නොතිබුණි. | අංක 267/2018 හා නොවැම්බර් 21 වන දිනැති චක්‍රලේඛයේ 8.2 ප්‍රකාරව කටයුතු කළයුතුය. | මේ සඳහා වූ වාහනවල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික සහන සේවා මධ්‍යස්ථානය විසින් ලබාදුන් වාහන 33 ක් පවතින අතර, ඒවායේ අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත තවමත් පවරා නැත. එබැවින්, අදාල විස්තර ගිණුම්ගත කර නැති අතර, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් වාහන පිළිබඳ අයිතිය තහවුරු කරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වටිනාකම රු.7,095,291 ක් වූ වාහන 07 ක් වෙන්දේසියේ අලෙවි කර තිබුණ ද, වාහනවල පිරිවැය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වටිනාකම් පොත්වලින් කපාහැරීමට කටයුතු කළ යුතුවීම. | අතපසුවීමකින් 2018 වර්ෂයේ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී ඉදිකිරීම් නිමකරන ලද රු.260,746,714 ක් වූ | අංක 267/2018 හා නොවැම්බර් 21 වන දිනැති චක්‍රලේඛයේ 8.2 ප්‍රකාරව කටයුතු කළයුතුය. | ගොඩනැඟිලිවල වටිනාකම ගිණුම්ගත කර ඇති බව දන්වමි. මෙම ගොඩනැඟිලිවල වියදම් |

| | | |
|---|---|---|
| කාර්යාල ගොඩනැගිලිවල වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. දරා ඇති පිරිවැය පමණක් ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර ඇත. අදාල වටිනාකම මගේ අංක ඩීඑස්පී/ඒසීසී/11/01/04 සහ 2019 ජනවාරි 09 දිනැති ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇති අතර, 2018 වර්ෂයට අදාල පරිපූර්ණ ගිණුම් සාරාංශ මඟින් ගිණුම් ගතකර ඇති බව දන්වමි. |
| (ඇ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ-6) අනුව 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වටිනාකම් හා භාණ්ඩාගාර මුද්‍රිත වටිනාකම් අතර නොසැසඳීම් අනාවරණය විය. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය හා භාණ්ඩාගාර මුද්‍රිත වටිනාකම් අතර වෙනස හඳුනාගෙන නිවැරදි කිරීම් සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකල යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ඇතුළත් කරන ලද දත්ත නිවැරදි (භාණ්ඩාගාරයේ මධ්‍යගත ගිණුම් පද්ධතියට) නොවීම තුළ මෙම වෙනස ඇති වී ඇත. මෙය නිවැරදි කිරීම සඳහා **DSP/ACC/8/Assest** සහ 2019 මාර්තු 05 දිනැති ලිපිය මඟින් ජර්නල් සටහන් යවා ඇති බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 පුනරාවර්තන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් පරිදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා පුනරාවර්ථන වැය විෂයයන් 12 කට සලසා තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 15 ක් මු.රෙ. 66 හා 69 හි විධිවිධාන අනුව වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. | අවශ්‍යතා පිළිබඳ විධිමත් හා ප්‍රමාණවත් ඇගයීමක් සිදුකර ඇස්තමේන්තු සකස් කළ යුතුවීම. | ඉතිරි වීම් ඇති වැය විෂයයන්වලින් අපේක්ෂා කළ පරිදි වියදම් සිදු නොවීම නිසා එසේ ඉතිරිවීම් මාරු කරන ලදී. |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවකයින් 07 දෙනෙකුගෙන් වර්ෂ තුනකට වැඩි කාළයක සිට අයවිය යුතුව පැවති රු.447,152 ක් වූ ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | ණය ශේෂය කපා හැරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

**2.3 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන අනතුරු 19 කට අදාල වූ ලිපිගොනු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොතිබීම නිසා එකතුව රු.1,318,233 ක අලාභහානි පිළිබඳ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | අදාල ලිපිගොනු පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත්කර ඇත. කමිටු වාර්තාවලින් පසු තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද නවගත්තේගම හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යාල ගොඩනැඟිලි ඉදිකිරීමේ දී | ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතුවීම. | ඉදිරියේ දී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර ව්‍යාපෘති ආරම්භ කරන බව. |

| | | | |
|---|---|---|---|
| | අදාළ ව්‍යාපෘති වෙනුවෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකර ව්‍යාපෘතිය අදියර කීපයක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. පලමු අදියර යටතේ ගොඩනැඟිලිවල බිම් මහලේ ටයිල් වැඩ  හා තීන්ත ආලේපන වැඩ විෂයයන් සිදු කර තිබුණද, අවසන් අදියර වන විට එම ටයිල් හා අලේප කරන ලද තීන්ත දුර්වර්ණවී තිබුණි. | | |
| (ආ) | කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ඉදිකිරීම් සිදු නොකිරීමට අදාළ රු.60,000 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | කාර්මික නිලධාරීගේ නිර්දේශය අනුව 2018 නොවැම්බර් 07 දිනැති ලිපිය ප්‍රකාරව දින 34 ක කල් දිගුවක් ලබාදී ඇත. |
| (ඇ) | ඇස්තමේන්තු වටිනාකම රු.21,574,425 ක් වූ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ පලමු අදියර සඳහා මිල ගණන් කැඳවීම වෙනුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව ලංසු කැඳවීමේ අවම කාලය ලෙස දින 21 ක් ලබාදිය යුතු වුවත්, දින 12 ක් පමණක් ලබාදී තිබුණි. | ජ්රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට හා අදාල ඉදිකිරීම් සඳහා වර්ෂය තුළ ඉතිරිවී ඇති කාලය සැළකිල්ලට ගෙන ලංසු ඉදිරිපත් කිරීම සඳහා අදාල දින ගණන ලබාදීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කළ බව. |
| (ඇ) | 2018 ජූලි 24 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණයක් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක  කරන ලද පුත්තලම කලපු උද්‍යානයේ (පන්සල පැත්ත) ඉදිකිරීම් කටයුතු රු.5,926,558 ක ගිවිසුම්ගත වටිනාකමකට කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා දී තිබුණි. එහෙත්  උක්ත ඉදිකිරීම් කටයුත්ත දැනට සංවර්ධනය කර අවසන් කොටසින් වෙන්වූ අදියරක් ලෙස ක්‍රියාත්මක කිරීමෙන් මෙම ව්‍යාපෘතියේ අදාලත්වය සහ ඵලදායකත්වය විගණනයේ දී මතභේදාත්මක විය. | රජයේ මුදල් ඵලදායීව යොදා ගතහැකි අයුරින් ව්‍යාපෘති සැළසුම් කළයුතු වීම. | කලපු වෙරළ උද්‍යාන භූමියේ අනවසරෙන් පදිංචිව සිටි පදිංචි කරුවන් ඉවත් කිරීමට අධිකරණ ක්‍රියාමාර්ගයක් ගනිමින් තිබූ බැවින්, සම්පූර්ණ වෙරළ බිම් කොටසම එකවර සංවර්ධනය කිරීමට කටයුතු යොදාගැනීමට නොහැකි වූ බව |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කරන ලද උඩප්පුව පොලිස් ස්ථානය අසල සිට සින්නකොලණිය දක්වා මාර්ගය කාපට් කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.14,075,523 ක ගිවිසුම්ගත වටිනාකමකට කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. කෙසේ වුවද අදාල මාර්ගය සංවර්ධනය කිරීමේ දී 2015 වසරේ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් රු.976,747 ක වියදමක් දරා කොන්ක්‍රීට් කර තිබූ මීටර් 92.5 ක ප්‍රමාණයක් ද, අදාල ව්‍යාපෘතියට ඇතුළත් වන පරිදි උක්ත ඇස්තමේන්තු සැකසීමට පියවර ගැනීම හේතුවෙන් පෙර වසරේ දැරූ රජයේ වියදම නිශ්කාර්ය වැයක් වී තිබුණි. | රජයේ මුදල් සඵලදායීව යොදා ගතහැකි අයුරින් ව්‍යාපෘති සැළසුම් කළයුතුය | මෙම මාර්ගය කාපට් කිරීමේ දී අබලන්ව පැවතුණ කොන්ක්‍රීට් කරන ලද කොටස ද සමඟ කාපට් කරන ලෙස ප්‍රදේශවාසීන් හා දේශපාලන අධිකාරියේ ඉල්ලීම් පැවතුණ බව. |
| (ඊ) | ප්‍රසම්පාදන තීරණ අංක 12 ට අදාලව පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් හා ගණකාධිකාරී ප්‍රසම්පාදන කමිටුවේ සභාපති හා කමිටු සාමාජිකයා ලෙස කටයුතු කර තිබුණි. එහෙත් එම නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරීයේ යෙදෙන දිනවලට ප්‍රසම්පාදන තීරණද ලබා දීම නිසා ක්ෂේත්‍ර රාජකාරී වෙනුවෙන් හා ප්‍රසම්පාදන කමිටු තීරණ වෙනුවෙන් එකම අවස්ථාවක කාර්යයන් දෙකම සඳහා දීමනා ලෙස රු.7,000 ක් හා රු.70,000 ක් වශයෙන් රු.77,000 ක් ගෙවා තිබුණි. | එකම රාජකාරී කාල සීමාවක් තුළ රාජකාරී කටයුතු 2 ක් වෙනුවෙන් දීමනා ගෙවීම සුදුසු නොවන බව. | මෙලෙස අත්සන් කල සියළු ප්‍රසම්පාදන තීරණයන් ප්‍රසම්පාදන මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනා සාකච්ඡා කර ගත් තීරණ වේ. අදාල දිනයන්හි දී ප්‍රාදේශීය ලේකම් තුමිය හා ගණකාධිකාරී හදිසි හා ප්‍රමුඛත්වය දියයුතු රාජකාරීවල යෙදීම නිසා කාර්යාල පරිශ්‍රයේ ඇති ප්‍රාදේශීය ලේකම් නිල නිවසේ දී කාර්යාල වේලාවෙන් බැහැරව ප්‍රසම්පාදන මණ්ඩලය රැස්වී තීරණ ගන්නා ලදි. නිලධාරීන් රාජකාරී යෙදෙන ආකාරය මත ප්‍රසම්පාදන කමිටුව රැස්වීමට අවශ්‍ය කාල වේලාවක් කාර්යාල වේලාව තුළ යොදා ගැනීමට නොහැකි වන අවස්ථා පැවතිය හැක. එවැනි අවස්ථාවකදී ප්‍රසම්පාදන කටයුතු |

| | | |
|---|---|---|
| | | ප්‍රමාදයකින් තොරව කිරීමේ අවශ්‍යතාවය මත අදාල දිනයන් හිදී මෙලෙස රැස්වී ප්‍රසම්පාදන තීරණ ලබාගන්නා ලදී. |

**3.2 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>------------------------ | **නිර්දේශය**<br>----------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>--------------------------- |
|---|---|---|
| 2016 පෙබරවාරි 12 දින රියදුරුගේ අපරික්ෂාකාරී ධාවනය මත කැබ් රථයක් අනතුරට පත්වී රු.180,500 ක අලාභයක් සිදුව තිබූ බවට අදාල අනතුර සම්බන්ධයෙන් සිදුකර තිබූ මූලික පරික්ෂණ මණ්ඩල වාර්තාවෙන් ද අනාවරණය කර තිබූ නමුත්, එකී අලාභය අයකරගෙන නොතිබුණි. | වත්කම්වල ආරක්ෂාව සම්බන්ධව වගකිව යුතු අංශවල අවධානය යොමු විය යුතු බව. | රියදුරුගෙන් අයකර ගැනීමට මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දී ඇත. රියදුරු විසින් අභියාචනයක් ද ඉදිරිපත් කර ඇත. |

**3.3 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>----------------------- | **නිර්දේශය**<br>-------------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>-------------------------- |
|---|---|---|
| (අ) මු.රෙ. 104 **(i)** ප්‍රකාරව පාඩුවක් හෝ අලාභහානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂා ආරම්භ කළයුතු වේ. එහෙත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 වසරේ සිදුව තිබූ වාහන **අනතුරු 07 ක්** සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළ යුතු වීම. | විගණනය විසින් එම අඩුපාඩුව පෙන්වා දීමෙන් පසු පරීක්ෂණ මණ්ඩලයක් පත්කර මු.රෙ.104(1) ප්‍රකාරව කටයුතු කරන ලදි. |

| | | |
|---|---|---|
| (ආ) 2014 සහ 2015 යන වර්ෂවල වාහන 02 කට සිදුව තිබූ රු.564,620 ක් වූ අලාභහානි වෙනුවෙන් අදාල රියදුරන් වගකිව යුතු බවට පරීක්ෂණ මණ්ඩල වාර්තා මගින් අනාවරණය කර තිබූ නමුත්, එකී අලාභ 2018 දෙසැම්බර් 31 දින වනවිටත්, අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි. | අදාල රියදුරන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. | එක් වාහනයක අලාභය අයකර ගැනීමට අවශ්‍ය නිර්දේශ අමාත්‍යාංශයට යොමු කර ඇත. අනෙක් වාහනයේ අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දී ඇත. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් භාරයේ ඇති නිල නිවාස 71 න් නිල නිවාස 10 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවති නමුත්, ඒ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා ඒවා විනාශයට භාජනය වෙමින් නිශ්ක්‍රීයව තිබුණි. | නිල නිවාසවල ආරක්ෂාව සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කළයුතුය. | ප්‍රතිපාදන ලැබුන සැනින් මෙම නිල නිවාස කඩා ඉවත් කිරීමට කටයුතු කෙරේ. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාජසේවා දෙපාර්තමේන්තුව මගින් පුත්තලම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ආබාධිත 79 දෙනෙකු සඳහා 2018 වර්ෂයේ දී ආබාධිත දීමනා (ජීවනාධාර) ලෙස රු.2,844,000 ක් ගෙවා තිබුණි. නමුත්, සත්‍ය වශයෙන් තවත් | මහජන අවශ්‍යතා කඩිනමින් සපුරාලීමට අවශ්‍ය විධිවිධාන යෙදීම. | පොරෙත්තු ලේඛන ගතව දැනට 66 දෙනෙකු සුදුසුකම් ලබා සිටිය ද ප්‍රතිපාදන නොමැති බැවින්, එම ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. ආබාධිත වූවන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය විසින් අනුමත කර, නව |

| | | |
|---|---|---|
| ආබාධිත පුරවැසියන් 66 දෙනෙකු සඳහා ආබාධිත ජීවනාධාරය ලබාදෙන ලෙස ඉල්ලීම් කර පොරොත්තු ලේඛන ගතවී ඇත. | | ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කිරීමට හැකියාව පවතින බව දන්වා සිටිමි. |

5. **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 යෙහි 2018 දෙසැම්බර් 31 දින වනවිට ජොෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 15 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 29 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 308 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 25 ක් පැවතුණි. ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 15 තුළ අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්), සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) යන තනතුරු 01 බැගින් හා ප්‍රාදේශීය ලේකම් තනතුරු 02ක්, සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 02ක්, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු 02 ක් හා ගණකාධිකාරී තනතුරු 07 ක් පවතින බව නිරීක්ෂණය විය. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කාර්මික නිලධාරී අනුමත තනතුරු 34 න් පුරප්පාඩු 21 ක් හා තාක්ෂණ සහායක අනුමත තනතුරු 18 න් පුරප්පාඩු 10 ක් පැවතුණි. ප්‍රාදේශීය ලේකම් වැනි ජොෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පැවතීමෙන් මහජන සේවා අඛණ්ඩව හා ඵලදායීව ඉටුකරලීම සඳහා දැඩි බලපෑමක් එල්ල විය හැකි බව නිරීක්ෂණය විය. කාර්මික නිලධාරී සහ කාර්මික සහායක පුරප්පාඩු හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘති ඇතුළු සංවර්ධන කටයුතුවල ඵලදායකත්වය හා ගුණාත්මකභාවය පිළිබඳව අවධානමක්ද පැවතිබව නිරීක්ෂණය විය. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර මහජන සේවාවන් අඛණ්ඩව හා කාර්යක්ෂමලෙස ඉටු කිරීම. | කාර්යමණ්ඩල වාර්තා මඟින් පුරප්පාඩු දන්වා ඇත. |